**වහාම ප්‍රකාශයට පත්කිරීම පිණිසයි**

## ශ්‍රී ලංකාව : දෙමළ කොටි සංවිධානය ඔවුන්ගේ බලප්‍රදේශවල සිටින සාමාන්‍ය ජනතාවට අතවර කරයි

*බලහත්කාරයෙන් බඳවාගැනීම සහ ගමන් බිමන් යාමේ සීමාවන් පැණවීම මගින් ජීවිත අවදානමට ලක්කෙරේ*

(2008 දෙසැම්බර් 15 වැනිදා, නිව්යෝර්ක් නගරය) - ශ්‍රී ලංකාවේ බෙදුම්වාදී දෙමළ කොටි සංවිධානය උතුරේ ඔවුන්ගේ බලප්‍රදේශය වන වන්නි පලාතේ වෙසෙන සාමාන්‍ය දෙමළ ජනතාව බලහත්කාරයෙන් තම සංවිධානයට බඳවා ගනිමින්, ඔවුන්ට අතවර කරමින් බලහත්කාරයෙන් වැඩගනිමින් හා ඔවුන්ගේ ජීවිත අනතුරට හෙලන අන්දමින් ගමන් බිමන් පිලිබඳව සීමා පණවමින් සිටින බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය අද නිකුත්කළ නිවේදනයක සඳහන් කරයි.

දෙමළ ජනතාව වෙනුවෙන් වෙනම රාජ්‍යයක් උදෙසා සටන් වැදී සිටින දෙමළ විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊය) තම පාලනය පවතින ප්‍රදේශවල වෙසෙන දෙමළ ජනතාව කුරිරු අන්දමින් අතවරයට ලක්කරන අන්දම "කොටුවීම සහ සහ නොසලකා හැරීම : වන්නි පළාතේ සාමාන්‍ය ජනතාවට එරෙහිව කෙරෙන එල්ටීටීඊයේ අතවර" මාතෘකාව යටතේ නිකුත්කරන ලද පිටු 17කින් යුත් එම වාර්තාවේ සවිස්තරව සඳහන්වේ.

"එල්ටීටීඊය දෙමළ ජනතාව වෙනුවෙන් සටන් වදින බව පවසන නමුත්, වන්නි පලාතේ වෙසෙන සාමාන්‍ය ජනතාව විඳින පීඩාවන්ට වැඩිපුරම වගකිවයුත්තේ එම සංවිධානය," බව හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ ආසියා කළාපය භර අධ්‍යක්ෂවරයා වන බ්‍රැඩ් ඇඩම්ස් ප්‍රකාශ කරයි. "ඉදිරියට එමින් සිටින ආණ්ඩුවේ හමුදා ක්‍රමයෙන් එල්ටීටීඊ පාලන ප්‍රදේශ අත්පත් කරගනිමින් සිටියදී, තමන් සටන්කරමින් සිටින්නේයයි එල්ටීටීඊය පවසන ජනතාව කෙරෙහිම ඔවුන්ගේ සැලකීම එන්න එන්නම නරක අතට හැරෙමින් පවතී."

දිගින් දිගටම දියත්වන ආණ්ඩුවේ හමුදා මෙහෙයුම් හමුවේ, එල්ටීටීඊ සංවිධානය තම පාලනය යටතේ සිටින සාමාන්‍ය ජනතාවට එල්ලකරන පීඩනය උත්සන්න කොට තිබේ. තමන්ගේ පාලනය පවතින ප්‍රදේශවලින් සාමාන්‍ය වැසියන් පිටවයාම වැලැක්වීම සඳහා බලහත්කාර බලපත්‍ර ක්‍රමයක් කාලාන්තරයක් මුලුල්ලේ ක්‍රියාත්මක කරමින් සිටි එල්ටීටීඊය, වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා කෙරෙන ඉතාම හදිසි අවස්ථාවක හැර, දැන් එම ප්‍රදේශයෙන් පිටව යාම සාමාන්‍ය ජනතාවට සම්පූර්ණයෙන්ම තහනම් කොට තිබේ. උත්තිට්ඨාන අභිමුව ජනතාවට ආණ්ඩුවේ පාලන ප්‍රදේශවලට යාමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීම මගින් ඔවුන්ට මානුෂික ආධාර ලබාගැනීමට තිබෙන මාර්ග එල්ටීටීඊය විසින් දරුණු අන්දමින් අසුරා දමනු ලැබ තිබේ. 2008 මාර්තු මාසයේ සිට සටන් පවතින ප්‍රදේශවලින් පලාවිත් තිබෙන්නේ දහසකට ආසන්න පිරිසක් පමණි.

"මූලික මානව හිමිකමක් වන ඔබ මොබ යාමේ අයිතිය මේ ජනතාවට අහිමිකිරීම මගින් එල්ටීටීඊය ලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය වැසියන් පිරිසක් සටන් පවතින භයානක කලාපයේ කොටුකරගෙන සිටින," බව ඇඩම්ස් පවසයි.

බලහත්කාරයෙන් සාමාජිකයන් බඳවාගැනීම පිලිබඳ දීර්ඝ ඉතිහාසයක් එල්ටීටීඊ සංවිධානයට පවතී. ලාබාල වියේ දරුවන් ඇතුලු තරුණයන් සහ තරුණියන් මෙසේ බලහත්කාරයෙන් බඳවාගැනීමේ ක්‍රියාදාමය මෑතදී ඉතා උත්සන්නවී තිබේ. කාලාන්තරයක් මුලුල්ලේ ඔවුන් පවත්වාගෙන ගිය තම පාලන ප්‍රදේශවල "එක පවුලකින් එක සාමාජිකයෙක්" බලහත්කාරයෙන් බඳවාගැනීමේ ප්‍රතිපත්තිය මෑතදී තවත් පුලුල් කළ එල්ටීටීඊය දැන් ඇතැම්විට එක පවුලකින් සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් තම සංවිධානයට ලබාදෙන මෙන් බලපෑම් කරමින් සිටී.

"එල්ටීටීඊයේ යකඩ හස්තයට කොටුවී සිටින මේ සාමාන්‍ය දෙමළ ජනතාව සටන්කරුවන් ලෙසින් බලහත්කාරයෙන් බඳවාගෙන යුධ පෙරමුන අසල බලහත්කාරයෙන් භයානක කම්කරු සේවාවන්හි නිරතකොට සිටින," බව ඇඩම්ස් පවසයි.

ජාත්‍යන්තර බලපෑම් උත්සන්නවීම සහ වෙනත් සාධකයන් එල්ටීටීඊය ළමා සොල්දාදුවන් බඳවාගැනීම අඩුවීමට හේතුවී තිබුණත්, ඔවුන් යලිත් වරක් වන්නි ප්‍රදේශයෙන් ළමා සොල්දාදුවන් බඳවාගැනීම උත්සන්න කොට ඇති බව අලුතින් ලැබෙන වාර්තාවලින් ඉඟිකෙරේ. එල්ටීටීඊ සාමාජිකයන් පාසල්වලට ගොස් වයස අවුරුදු 14 සිට 18 දක්වාවූ තරුණ තරුණියන්ට තම සංවිධානයට බැඳෙන මෙන් බලකොට තිබේ.

පුහුණුව හමාරකරන අවස්ථාව වනවිට වයස අවුරුදු 18 සම්පූර්ණකොට තිබිය හැකි බැවින් ළමා ආරක්ෂක සංවිධානවලට ඒ' පිලිබඳව වාර්තාවුවද ඒ' වනවිට ඔවුන් තවදුරටත් ළමයින් නොවේය යන පදනම මත එල්ටීටීඊය සාමාන්‍යයෙන් වයස අවුරුදු 17 ළමුන් යුධ පුහුණුවට පිටත්කරයි.

"පසුගිය අවුරුද්දේ ඔවුන් 1990 ඉපදුන අය බඳවාගත්තා - මේ අවුරුද්දෙ බඳවගන්නෙ 1991 ඉපදුන අය," වන්නි පළාතේ මානුෂික ආධාර කටයුතුවල නිරතවී සිටින නිළධාරියෙක් හියුමන් රයිට්ස් වොච් සංවිධානයට පැවසීය. "ඔවුන් පවුලේ සාමාජිකයන්ගෙ හැඳුනුම් පත් බලලා බාල දරුවො අරගෙන යනවා. හදිසියෙවත් යුද්ධෙට යන වයසෙ ඉන්න කවුරුහරි හැංගුනොත්, තමන්ට අවශ්‍ය පිරිමි දරුව හරි ගැහැණු දරුව හරි ලැබෙනකම් ඔවුන් ඊට බාල වයසෙ දරුවන් නැත්නම් තාත්තව අරගෙන ගිහින් තියාගන්නව."

ගතව ගිය වසර 25 තුල සාමාන්‍ය වැසියන් ඉතා විශාල සංඛ්‍යාවක් මරාදමා ඇති එල්ටීටීඊ සංවිධානය, ශ්‍රී ලංකාවේදී සහ වෙනත් රටවලදී දේශපාලන ඝාතන සිදුකොට ඇති අතර මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරද එල්ලකොට තිබේ. ශ්‍රී ලංකාවේ සුලුතර දෙමළ සමාජය තුලින් මතුවුන දේශපාලන විරුද්ධවාදීන් සංවිධානාත්මකව විනාශකොට දැමූ එල්ටීටීඊය, මාධ්‍යවේදීන් සහ විරුද්ධවාදී සංවිධානවල සාමාජිකයන් විශාල පිරිසක් ඝාතනය කිරීම සම්බන්ධයෙන්ද වගකිව යුතුවෙයි. මූලික මානව අයිතිවාසිකම් වන භාෂණයේ නිදහස, එකමුතු වීමේ නිදහස, රැස්වීමේ නිදහස, සහ ඔබ මොබ යාමේ නිදහසට වැට බඳිමින් එල්ටීටීඊය තමන්ගේ පාලන ප්‍රදේශයේ සිටින ජනතාව මත භීෂණකාරී පාලනයක් පවත්වාගෙන යයි.

"කොටුවීම සහ නොසලකා හැරීම " වාර්තාව මගින් හියුමන් රයිට්ස් වොච් සංවිධානය :

- තම පාලනය යටතේ තිබෙන ප්‍රදේශවල සිටින ජනතාව එයින් පිටවයාම වැලැක්වීම නවත්වන ලෙසත්; ආරක්ෂාව පතා ආණ්ඩුවේ පාලන ප්‍රදේශවලට යාම ඇතුලු සාමාන්‍ය වැසියන්ගේ ඔබ මොබ යාමේ අයිතියට ගරුකරන ලෙසත්;

- එල්ටීටීඊයට බලහත්කාරයෙන් සාමාජිකයන් බඳවාගැනීම නවත්වන ලෙසත් ; පැහැර ගැනීම් ඇතුලු සියලුම බලහත්කාර ක්‍රියාකාරකම් නවත්වන ලෙසත්;

- වයස අවුරුදු 18ට අඩු දරුවන් බඳවාගැනීම නවත්වන ලෙසත් ; හමුදා මෙහෙයුම්වලට දරුවන් යොදාගැනීම නවත්වන ලෙසත්; ළමා වයසේදී සංවිධානයට බඳවාගෙන දැනට වයස අවුරුදු 18 සම්පූර්ණකොට සිටින්නන් ඇතුලු දැනට සංවිධානයේ සිටින සියලුම ළමා සොල්දාදුවන් නිදහස් කරන ලෙසත් ;

- වේතන නොගෙවා ළමුන් වැඩෙහි යෙදවීම හෝ "ස්වේච්ඡාවෙන්" වැඩෙහි යෙදීම ලෙස ඔවුන් හඳුන්වන තත්ත්වය ඇතුලු සියලුම ආකාරයේ ළමා ශ්‍රම සූරාකෑම් නවත්වන ලෙසත් ; සියලුම පවුල් එල්ටීටීඊයට කම්කරු සෙවාවන් සැපයිය යුතු බවට කෙරෙන බලපෑම් නතර කරන ලෙසත් ; බංකර සහ අගල් ඉදිකිරීම වැනි හමුදා මෙහෙයුම්වලට කෙලින්ම සම්බන්ධ කම්කරු වඩවල යෙදෙන මෙන් සාමාන්‍ය වැසියන්ට බලකිරීම නවත්වන ලෙසත් ;

- මානුෂික ආධාර ආයතන සහ එක්සත් ජාතීන්ගේ ආයතනවලට එල්ටීටීඊ පාලනය පවතින ප්‍රදේශවලට ආරක්ෂා සහිතව හා බාධාවකින් තොරව ඇතුලුවීම සඳහා අවසර දෙන මෙන් හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සේවය කරන වන්නි පලාත්වාසීන් ඇතුලු සියලුම මානුෂික ආධාර සේවකයන්ගේ ආරක්ෂාව සහතික කරන ලෙසත් ;

එල්ටීටීයෙන් ඉල්ලා සිටී.